***සැ.යු.***: 2026.06.26 පළ වූ 2495 *ගැසට් පත්‍රයේ* I කොටස III ඡේදය පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,496 - 2026 ජූලි මස 03 සිකුරාදා - 2026.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 2868 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 2896 |


***සැ.යු.***: ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) සංශෝධන) පනත් කෙටුම්පත 2026.06.26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 24 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 10 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


2865 - B 82806 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය)

**රෙජිස්ට්‍රාර් තනතුරු යාපනය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 27 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මැයි මස 13 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| යාපනය | වේලනයි | පුන්කුඩුතීවු කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වේලනයි කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | තෙල්ලිප්පලයි | මයිලිඩ්ඩි කොට්ඨාසයේ, උප්පැන්න, මරණ සහ වලි උතුර (තෙල්ලිප්පලයි) කොට්ඨාසයේ, (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | කයිට්ස් | අනලයිතීවු කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කයිට්ස් කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |

07 - 20

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**නීතිපති දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුර සඳහා බඳවා ගැනීම 2026**

නීතිපති දෙපාර්තමේන්තුවේ, කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුරුවල පවතින පුරප්පාඩු 09 ක් සඳහා සුදුස්සන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් අයදුම්පත්‍ර බාගත කරගත හැකි අතර, අයදුම්පත්‍ර පහත සඳහන් දිනට හෝ ඊට පෙර නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ.පෙ. 502, කොළඹ 12 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ "කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුර සඳහා අයදුම් කිරීම - 2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.08.03 දින වේ.
*සටහන* : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර අසම්පූර්ණ අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 50ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා සේවා අවශ්‍යතාවය අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 09 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හි ඇතුළත් කොන්දේසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

**3. වැටුප් පරිමාණය :-**

මෙම තනතුරට AGS 1-2025, රු.82,150 -10x2,400- රු. 106,150 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

**4. අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් :**

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම හා නොතාරිස් ආඥාපනත යටතේ නිකුත් කරන ලද වලංගු නොතාරිස් බලපත්‍රයක් තිබීම.

ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

**5. පළපුරුද්ද :**

ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

**6. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි වීම.

**7. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරෙහි රාජකාරී මැනවින් ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.

**8. වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය.)

iii. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබිය යුතුය.

iv. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් 2026.08.03 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**9. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

I. ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අධ්‍යාපන සුදුසුකම්** | | 20 |
| | i. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය | 08 | |
| | ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය | 07 | |
| | iii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය | 06 | |
| | iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය | 06 | |
| | v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය | 05 | |
| | vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) | 04 | |
| | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලය මඟින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 03 | |
| | viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 02 | |
| | ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය. | 03 | |
| | (ඉහත සඳහන් සියළුම කුසලතාවයන් උපරිම ලකුණු 20කට සීමා වේ.)<br><br>*ඉහත අධ්‍යාපන සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය. | | |
| 02 | **වෘත්තීය පළපුරුද්ද** | | 20 |
| | i. ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීම. (එක් අවුරුද්දක් සඳහා ලකුණු 02 බැගින්) | 10 | |
| | ii. රජයේ හෝ පිළිගත් නීති ආයතනයක ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීමෙන් දක්වන ලද කුසලතා<br>(ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය.) | 10 | |
| | *සටහන.-* විනිශ්චයකාරවරයෙකුගෙන් වෘත්තීය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ. | | |

| අනු අංකය | ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03. | **විශේෂ දක්ෂතා** | | 20 |
| | i. සන්නිවේදන කුසලතාවය | 05 | |
| | ii. හිටිවන කවිකත්වයේ කුසලතාවය | 05 | |
| | iii. සභාව ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය | 05 | |
| | iv. භාෂාව හැසිරවීමේ හැකියාව | 05 | |
| 04. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා** | | 40 |
| | i. පෞරුෂත්වය | 05 | |
| | ii. ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව | 15 | |
| | iii. නායකත්ව ගුණාංග | 05 | |
| | iv. නීතිය හා අධිකරණ කටයුතු පිළිබඳව ඇති දැනුම | 15 | |
| | **එකතුව** | | 100 |

II. අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| I. තර්ක ශක්තිය | 25 |
| II. කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව | 25 |
| III. ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව | 25 |
| IV. මූලික නෛතික සිද්ධාන්ත දැනුම | 25 |
| එකතුව | 100 |

**10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සැලකිය යුතුය :*

*අ.* අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 9-I හි අනු අංක 01 හා 02 යටතේ පිළිවෙලින් දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පලපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතික පත් හා ලියවිලිවල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

*ආ.* සම්මුඛ පරීක්ණයේ දී සියලුම සහතික හා ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**12.** පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීමේ හෝ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් පිරවීම හෝ මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණක් පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**13.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**14.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

නීතිපති.

2026 ජුනි මස 26 දින,
උපරිමාධිකරණ සංකීර්ණය,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

07-80

---

**පරිසර අමාත්‍යාංශය**

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ III ශ්‍රේණියේ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ක්‍රමලේඛක තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ක්‍රමලේඛක තනතුරු 01ක් සඳහා වන බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට , එනම් 2026.08.03 වන දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය**

1.1. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

1.2. මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

1.3. අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධාරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන අතර එය අවසාන තීරණය වනු ඇත.

1.4. මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**2. සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ භූගෝල විද්‍යා උපාධිය සමත් වීම.

**2.2 වෘත්තීය සුදුසුකම්**

අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**2.3 පළපුරුද්ද**

අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**2.4 කායික සුදුසුකම්**

විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**2.5** වෙනත්

**2.5.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

**2.5.2.** විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**2.5.3.** තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.6** වයස :

**2.6.1.** අවම සීමාව : අවුරුදු 21
**2.6.2.** උපරිම සීමාව : අවුරුදු 35

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

**3.1** මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

**3.2** අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

**3.3** තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

**3.4** භාෂා ප්‍රවීණතාවය:

**3.4.1.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :
ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බඳවාගත් නිලධාරියෙකු පරිවාස කාලය තුළ සිංහල හෝ දෙමළ භාෂාවක ප්‍රවීණතාවය ලබාගත යුතුය. එම ප්‍රවීණතා මට්ටම වන්නේ අ.පො.ස.(සා.පෙළ.) විභාගයෙන් සිංහළ / දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස සමත් වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන විශේෂිත කුසළතා විභාගයෙන් සමත් වීම.

**3.4.2.** අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :

| *ප්‍රවීණතාවය ලබාගත යුතු කාලසීමාව* | *ලබා ගත යුතු ප්‍රවීණතා මට්ටම* | *භාෂා ප්‍රවීණතාවය* | |
|---|---|---|---|
| | | *සේවයට බඳවා ගත් භාෂා මාධ්‍ය* | *භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු භාෂාව* |
| සේවයට බැඳි පළමු වසර තුන(3) ඇතුළත | රාජ්‍ය සේවා චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. | සිංහල | දෙමළ |
| | | දෙමළ | සිංහල |
| | | ඉංග්‍රීසි | උපඡේද අංක 3.4.1 යටතේ ප්‍රවීණතාවය ලබා ගත් රාජ්‍ය භාෂාව හැර අනෙක් රාජ්‍ය භාෂාව |

**4. මාසික වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2025 හි MN 4 -2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු.53,060/-10x800-11x1,190-10x1,320-5x1,350 = රු.94,100/= මාසික වැටුප් පරිමාණයක් හිමිය. (එම වැටුප ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ :-**
**සංලක්ෂය :-**

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:**<br>**අධ්‍යාපන සුදුසුකම් :**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ භූගෝල විද්‍යා උපාධිය<br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | **45** |
| | - දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පංතියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | **වෘත්තීය සුදුසුකම් :**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයක් මගින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | 25 | |
| 02 | **අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද :**<br>භූගෝල විද්‍යා තොරතුරු පද්ධති සම්බන්ධ පළපුරුද්ද -<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 10<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02 | | **10** |
| 03 | **පරිගණක හැකියාව :**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500ක පාඨමාලාවක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06 / පැය 720<br>- මාස 03/ පැය 360 | 20<br><br>10<br><br><br>07<br>05 | **20** |
| 04 | **භාෂා ප්‍රවීණතාවය :**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය / උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01 හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06 / පැය 720<br>- මාස 03/ පැය 360 | 20<br><br><br>10<br><br><br>07<br>05 | **20** |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය , පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා: | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

* ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

**6.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

**6.2** සම්මුඛ පරීක්ෂණයේදී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**6.3** සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍රවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

**6.3.1.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත :

**6.3.2.** වලංගු විදේශ ගමන් බලපත්‍රය :

**6.3.3.** වලංගු රියදුරු බලපත්‍රය.

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

**7.1** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශීර්ෂ අංකය 01 සිට 06 දක්වා පළමු පිටුවේද 07 සිට 09 දක්වා දෙවන පිටුවේද 10 සිට 11 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

**7.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට , වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ 2026.08.03 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ක්‍රමලේඛක තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**7.3** අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.82,150/= ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්.

**2026 ජුනි මස 24 වැනි දින,**
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,

ආදර්ශ අයදුම් පත්‍රය

**පරිසර අමාත්‍යාංශය**

***වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ III ශ්‍රේණියේ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ක්‍රමලේඛක තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026***

1. මුලකුරු සමඟ නම-:
..............................................................................................................................................................
.........................................................................................................................(මයා/මිය/මෙනවිය)

සිංහලෙන්-
:.............................................................................................................................................................
..............................................................................................................................................................

ඉංග්‍රීසියෙන්-
:.............................................................................................................................................................
..............................................................................................................................................................

1.1. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන්-
:.............................................................................................................................................
..............................................................................................................................................
ඉංග්‍රීසියෙන්-
:.............................................................................................................................................
..............................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය-:.................................................

3. උපන් දිනය -:
වර්ෂය:.......................... මාසය:................................. දිනය:.................................

4. ස්ත්‍රී / පුරුෂභාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

5. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) –
:.............................................................................................................................................................
..............................................................................................................................................................

6. දුරකථන අංකය -: ස්ථාවර:.............................. ජංගම:.....................................

7. අධ්‍යාපන සුදුසුකම් :

7.1. අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
I. විභාගයේ වර්ෂය හා මාසය :..........................................................
II. විභාග අංකය :..........................................................
III. සමත් වූ වර්ෂයන් :..........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

7.2. තනතුරට අදාළ සුදුසුකම් :

| *අදාළ සුදුසුකම්* | *සුදුසුකම් ලැබූ ආයතන* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |

7.3. අමතර සුදුසුකම් : ..............................................................................................................................................

8. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව්/නැත

8.1. ඔව් නම් විස්තරය සඳහන් කරන්න :
..............................................................................................................................................................
..............................................................................................................................................................

9. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් :

1. නම : ................................................
තනතුර : ................................................
ලිපිනය : ................................................
දුරකථන අංකය : ................................................

2. නම : ................................................
තනතුර : ................................................
ලිපිනය : ................................................
දුරකථන අංකය : ................................................

10. අයදුම්කරුගේ සහතිකය :

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පුවුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.

(*ඇ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය:..................................... ..........................................................
අයදුම්කරුගේ අත්සන

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ..................................................................................නැමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය .......................................... දින මා ඉදිරිපිටදී ඉහත 10 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

................................................................
සහතික කරන අයගේ අත්සන.

දිනය :
සහතික කරන අයගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

07-44

---

**පරිසර අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් විදුලි කාර්මික තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් විදුලි කාර්මික තනතුරක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.08.03.වන දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**1.1.** මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**1.2.** සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර බඳවාගනු ලැබේ.

**1.3.** අපේක්ෂකයන් එක් අයකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධාරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් වන මා විසින් තීරණය කරනු ලබන අතර එය අවසාන තීරණය වනු ඇත.

**1.4.** මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරල සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් තීරණය කරනු ලැබේ.

**2. සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම්**
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

**2.2 වෘත්තීය සුදුසුකම්**
එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි ( N.V.Q) දෙවෙනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**2.3 පළපුරුද්ද**
අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**2.4 කායික සුදුසුකම්**
විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් හා තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**2.5 වයස**
**2.5.1** අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
**2.5.2** උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

**2.6 වෙනත්**
**2.6.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
**2.6.2.** අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
**2.6.3.** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

**3.1** මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.
**3.2** අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය.
**3.3** තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු ය.
**3.4** භාෂා ප්‍රවීණතාවය:

**3.4.1.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය:

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතු ය. |

**4. මාසික වැටුප් පරිමාණය**
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2025 හි PL-2 -2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු.41,800/ -10x490 -10x540 -10x590 -12x630 - රු. 65,560/= මාසික වැටුප් පරිමාණයක් හිමිය. (එම වැටුප ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ :-**
***සංලක්ෂය :-***

**5.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :-

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්:**<br>- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයන් තුන සමත් නම් | 15 | 15 |
| | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයන් දෙකක් සමත් නම් | 10 | |
| | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) එක් විෂයක් සමත් නම් | 05 | |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | **අතිරේක වෘත්තීය සුදුසුකම් :**<br>විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් ලබාදෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුද්දක නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | -<br>35 | 35 |
| | විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 20 | |
| | විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 20 | |
| 03 | **අතිරේක පළපුරුද්ද :**<br>අදාළ ක්ෂේත්‍රයට අදාළව ආයතනයක සේවය කර ඇති කාලය මත ලකුණු ලබා දෙනු ලැබේ.<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 45<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br><br>(අදාළ ආයතනයෙන් ලබාගත් සේවා සහතිකයක් මඟින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. මුද්‍රාව යොදා තිබීම අනිවාර්ය වේ.) | | 45 |
| 04 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය , පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා: | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

- ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතු ය.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

**6.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

**6.2** සම්මුඛ පරීක්ෂණයේදී සියළුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**6.3** සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

**6.3.1.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

**6.3.2.** වලංගු විදේශ ගමන් බලපත්‍රය,

**6.3.3.** වලංගු රියදුරු බලපත්‍රය.

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

**7.1** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශීර්ෂ අංකය 01 සිට 04 දක්වා පළමු පිටුවේද, 05 සිට 08 දක්වා දෙවන පිටුවේ ද, 09 සිට 13 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

**7.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ, අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට 2026.08.03 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි විදුලි කාර්මික තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**7.3** අයදුම්පත්‍රයේ අපේක්ෂිතයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරියෙකු හෝ රු.82,150/= ක හෝ ඊට ඉහළ මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් ලබන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජුනි මස 24 වැනි දින,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

පරිසර අමාත්‍යාංශය

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුර සඳහා බඳවා ගැනීම**

අයදුම් කරන භාෂා මාධ්‍යය :
සිංහල -2
දෙමළ -3 ☐
ඉංග්‍රීසි - 4

1. මුලකුරු සමඟ නම :
..............................................................................................................................................
.....................................................................(මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :
..............................................................................................................................................
..............................................................................................................................................
ඉංග්‍රීසියෙන් :
..............................................................................................................................................
..............................................................................................................................................

1.1. මුලකුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන් :
.............................................................................................................................................................
.............................................................................................................................................................
ඉංග්‍රීසියෙන් :
.............................................................................................................................................................
.............................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :.................................................

3. උපන් දිනය :
වර්ෂය:.......................... මාසය:................................ දිනය:................................

4. ස්ත්‍රී / පුරුෂභාවය ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

5. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :
.............................................................................................................................................................
.............................................................................................................................................................

6. දුරකථන අංකය : ස්ථාවර:.............................. ජංගම:.....................................

7. අධ්‍යාපන සුදුසුකම් :

7.1. *අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*
I. විභාගයේ වර්ෂය හා මාසය : .........................................................
II. විභාග අංකය : .........................................................
III. සමත් වූ වර්ෂය : .........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7.2. *අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*
IV. විභාගයේ වර්ෂය හා මාසය :.........................................................
V. විභාග අංකය :.........................................................
VI. සමත් වූ වර්ෂය :.........................................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

8. වෘත්තීය සුදුසුකම් :
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

9. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව්/නැත
    10.1. *"ඔව්" නම් විස්තරය සඳහන් කරන්න :*
    .......................................................................................................................................
    .......................................................................................................................................

11. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් :

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නම | : ............................................ | 2. | නම | : ............................................ |
| | තනතුර | : ............................................ | | තනතුර | : ............................................ |
| | ලිපිනය | : ............................................ | | ලිපිනය | : ............................................ |
| | දුරකථන අංකය | : ............................................ | | දුරකථන අංකය | : ............................................ |

12. *අයදුම්කරුගේ සහතිකය :*

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.
(*ඇ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය:.....................................                    .........................................................,
අයදුම්කරුගේ අත්සන.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ..........................................................................................නැමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය .......................................... දින මා ඉදිරිපිටදී ඉහත 12 ඡෙදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

................................................................,
සහතික කරන අයගේ අත්සන.

දිනය :
සහතික කරන අයගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

07-42

## පරිසර අමාත්‍යාංශය

### වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් මැනුම් සහායක තනතුරු සඳහා වන බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් මැනුම් සහායක තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.08.03 වන දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**1.1.** මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**1.2.** සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

**1.3.** අපේක්ෂකයන් එක් අයකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් වන මා විසින් තීරණය කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

**1.4.** මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් තීරණය කරනු ලැබේ.

**2. සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම්**
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

**2.2 වෘත්තීය සුදුසුකම්**
මැනුම් සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවෙනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**2.3 පළපුරුද්ද**
අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**2.4 කායික සුදුසුකම්**
විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් හා තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**2.5 වයස**

**2.5.1** අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
**2.5.2** උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

**2.6 වෙනත්**

**2.6.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

**2.6.2.** අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

**2.6.3.** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

**3.1** මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

**3.2** අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

**3.3** තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු ය.

**3.4** භාෂා ප්‍රවීණතාවය:

**3.4.1.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය:

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |

**4. මාසික වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2025 හි PL-2 -2025 වැටුප් කාණ්ඩය අනුව, මෙම තනතුරට රු.41,800/ -10x490 -10x540 -10x590 -12x630 - රු. 65,560/= මාසික වැටුප් පරිමාණයක් හිමිය. (එම වැටුප ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ :-**
**සංලක්ෂය :**

**5.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :-

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්:**<br>- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් තුන සමත් නම් | 15 | **15** |
| | - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් දෙකක් සමත් නම් | 10 | |
| | - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) එක් විෂයක් සමත් නම් | 05 | |
| 02 | **අතිරේක වෘත්තීය සුදුසුකම්**<br>මැනුම් සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන අවුරුද්දක නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | -<br>35 | **35** |
| | මැනුම් සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 20 | |
| | මැනුම් සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 10 | |
| 03 | **අතිරේක පළපුරුද්ද**<br>අදාළ ක්ෂේත්‍රයට අදාළව ආයතනයක සේවය කර ඇති කාලය මත ලකුණු ලබා දෙනු ලැබේ.<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 45<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br><br>(අදාළ ආයතනයෙන් ලබාගත් සේවා සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. මුද්‍රාව යොදා තිබීම අනිවාර්ය වේ.) | | **45** |
| 06 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය , පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා | | **05** |
| | **මුළු එකතුව** | | **100** |

ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය**

**6.1** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

**6.2** සම්මුඛ පරීක්ෂණයේදී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

**6.3** සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

**6.3.1.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

**6.3.2.** වලංගු විදේශ ගමන් බලපත්‍රය,

**6.3.3.** වලංගු රියදුරු බලපත්‍රය.

**7. අයදුම් කිරීමේ ක්‍රමය**

**7.1** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශිර්ෂ අංකය 01 සිට 04 දක්වා පළමු පිටුවේ ද 05 සිට 08 දක්වා දෙවන පිටුවේ ද 09 සිට 13 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**7.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ, අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට , 2026.08.03 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි මැනුම් සහායක තනතුර සඳහා වන බඳවා ගැනීම - 2026**" යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**7.3** අයදුම්පත්‍රයේ අපේක්ෂිතයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරියෙකු හෝ රු.82,150/= ක් හෝ ඊට ඉහළ මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් ලබන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්.

**2026 ජුනි මස 24 වැනි දින,**
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

පරිසර අමාත්‍යාංශය

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මැනුම් සහායක තනතුර සඳහා බඳවා ගැනීම**

අයදුම් කරන භාෂා මාධ්‍යය
සිංහල -2
දෙමළ -3 ☐
ඉංග්‍රීසි - 4

1. මුලකුරු සමඟ නම :-
..........................................................................................................................................................
..........................................................................................................................................(මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :-
..........................................................................................................................................................
..........................................................................................................................................................
ඉංග්‍රීසියෙන් :-
..........................................................................................................................................................
..........................................................................................................................................................

1.1. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන්-
:.......................................................................................................................................................
..........................................................................................................................................................
ඉංග්‍රීසියෙන්-
:.......................................................................................................................................................
..........................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................................

3. උපන් දිනය :-
වර්ෂය:.......................... මාසය:................................ දිනය:.................................

4. ස්ත්‍රී / පුරුෂභාවය ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

5. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :-
..........................................................................................................................................................
..........................................................................................................................................................

6. දුරකථන අංකය :- ස්ථාවර:.............................. ජංගම:.....................................

7. අධ්‍යාපන සුදුසුකම් :-

7.1. අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය :- .........................................................

II. විභාග අංකය :- ........................................................
III. සමත් වූ වර්ෂය :- ........................................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7.2. අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර
IV. විභාගයේ වර්ෂය හා මාසය :-........................................................
V. විභාග අංකය :-........................................................
VI. සමත් වූ වර්ෂය :-........................................................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

8. වෘත්තීය සුදුසුකම් :-
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

9. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :-
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව්/නැත

10.1. ඔව් නම් විස්තරය සඳහන් කරන්න :-
..........................................................................................................................................................
..........................................................................................................................................................

11. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් -:

1. නම :-
තනතුර :-
ලිපිනය :-
දුරකථන අංකය :-

2. නම :-
තනතුර :-
ලිපිනය :-
දුරකථන අංකය :-

12. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පුවුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.
(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය:.................................... ....................................................,
අයදුම්කරුගේ අත්සන.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ........................................................................................නමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය .......................................... දින මා ඉදිරිපිටදී ඉහත 12 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

...............................................................,
සහතික කරන අයගේ අත්සන.

දිනය :-
සහතික කරන අයගේ නම :-
තනතුර :-
ලිපිනය :-
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

07-43

---

**පරිසර අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ III ශ්‍රේණියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තුගත කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරු 09 ක් සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

**(I) අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) සමත්ව තිබීම.

**(II) පළපුරුද්ද :**
ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන හෝ අර්ධ ශිල්පීය තනතුරක නියමිත දිනයට පූර්වාසන්නව අවුරුදු 05 ක ස්ථිර හා සක්‍රිය සේවා කාලයක් සපුරා තිබිය යුතුය. අදාළ තනතුරේ පත්වීමෙහි ස්ථිර කර තිබිය යුතුය.

*සටහන*
යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාලපරිච්ඡේදයක් ඉහත සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන්ගනු නොලැබේ. එසේම යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති

තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද ද ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන්ගනු නොලැබේ.

**(III) වෘත්තීය සුදුසුකම් :** අදාළ නොවේ.

**(IV) කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

**(V) වෙනත් :**

(අ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ආ) පූර්වාසන්න වසර පහ තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**(VI) වයස :** අදාළ නොවේ.

**03. වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, මාසික වැටුප් පරිමාණය :

රු.45,230 - 10x540 - 11x630 - 10x890 – 10x1190 - රු.78,360/- ( MN 1 – 2025 ) වේ.

**04. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමනයන් හා සේවා කොන්දේසි :**

(අ) වෙරළ සංරක්ෂණ නියාමක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්වේ.)

(ආ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(ඇ) තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර තුනක් (03)ක් ඇතුළත පළමුවන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

(ඉ) තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

(ඊ) මෙම තනතුරු පුරප්පාඩු උතුරු පළාත සහ නැගෙනහිර පළාත තුළ පිහිටා ඇති වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල තුළ පමණක් පවතින බැවින්, මෙම තනතුරට තෝරා ගනු ලබන නිලධාරීන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත ප්‍රාදේශීය කාර්යාලවල පවතින පුරප්පාඩු සඳහා පමණක් අනුයුක්ත කරනු ලැබේ. තෝරා ගනු ලබන නිලධාරීන් අනුයුක්ත කරනු ලබන ප්‍රාදේශීය කාර්යාලය සහ අනුයුක්ත කරනු ලබන නිලධාරී සංඛ්‍යාව තීරණය කිරීම හා වෙනස් කිරීමේ අයිතිය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

| *අනු. අංකය* | *වෙරළ සංරක්ෂණ නියාමක තනතුරු පුරප්පාඩු පවතින ප්‍රාදේශීය කාර්යාල* | *අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | යාපනය ප්‍රාදේශීය කාර්යාලය | 03 |
| 02 | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| 03 | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| 04 | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| අනුයුක්ත කරනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව | | 09 |

**05. තනතුරු සඳහා තෝරාගනු ලබන ක්‍රමය :-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට මෙම තනතුර සඳහා පත්වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| *අනු. අංකය* | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 60 |
| 02 | පළපුරුද්ද | 15 |
| 03 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 20 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 |
| එකතුව | | 100 |

**06. අයදුම් කිරීමේ ක්‍රමය :**

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.08.03** දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු යි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ නියාමක III ශ්‍රේණියේ සීමිත බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**07. සුදුසුකම් පිළිබඳ ලියවිලි :-**

(*අ*) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(*ආ*) සම්මුඛ පරීක්ෂණයේදී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
iii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය
iv. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය
v. චරිත සහතික දෙකක්
vi. වෙනත් අදාළ සහතික

**08. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09**. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

10. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදනය අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

මහාචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර,
අධ්‍යක්‍ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්,
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

2026 ජුනි මස 23 වැනි දින,
තැ.පෙ. 556,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

පරිසර අමාත්‍යාංශය

***වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ***
***කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ III ශ්‍රේණියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2026***

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..................................................................................................
..................................................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ............................
.............................................................................................................................................................
(උදා : GUNAWARDANA H.M.S.K.)

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.......................................................................................
.............................................................................................................................................................

2.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................................

2.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :...............................................................................................................

2.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

03. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.2 නිකුත් කළ දිනය : [ ]

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]

පුරුෂ - 0

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. 5.1 උපන් දිනය:

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

5.2 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

06. 6.1 ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ :

පරම්පරාවෙන් - 1 [ ]

ලියාපදිංචියෙන් - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.2 ජනවර්ගය : [ ]

සිංහල - 1

ලංකා දෙමළ - 2

ඉංදියානු දෙමළ - 3

මුස්ලිම් - 4

බර්ගර් - 5

වෙනත් - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. විවාහක / අවිවාහක / වැන්දඹු ද යන වග :

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |
| වැන්දඹු | |

08. 8.1. වර්තමාන සේවා ස්ථානයේ නම :...............................................................................................................
8.2. වර්තමාන තනතුරේ නම :...............................................................................................................
8.3. වර්තමාන තනතුරට පත්වූ දිනය :...............................................................................................................
8.4. වර්තමාන තනතුරේ ස්ථිර වූ දිනය :...............................................................................................................
8.5. වර්තමාන තනතුරේ වසර 05 ක ස්ථිර හා සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරන දිනය: ........................................................

09. ඔබ උසාවියකින් වරදකරුවකු වී තිබේද? : ...............................................................................................................
එසේ නම් හේතු දක්වන්න : ...............................................................................................................

10. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ සාමාර්ථයන් :

| වර්ෂය : ........................ විභාග අංකය : .......................................... | |
|---|---|
| ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

11. අ.පො.ස. උසස් පෙළ විභාගයේ සාමාර්ථයන් :

| වර්ෂය : ........................ විභාග අංකය : .......................................... | |
|---|---|
| ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | |
| | |
| | |
| | |

12. වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ...............................................................................................................
...............................................................................................................

13. අයදුම්කරුගේ ප්‍රකාශය / සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු

බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

....................................................

අයදුම්කරුගේ අත්සන

දිනය : .................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු ය.**

01. පූර්වාසන්න වසර 05 තුළ මෙම නිලධාරියාට එරෙහිව විනය කටයුතු කිසිවක් කර ඇති ද / ඉදිරියේදී කිරීමට අදහස් කරන්නේ ද යන්න? ඔව් / නැත

02. පිළිතුර **"ඔව්"** නම් ඒ පිළිබඳ ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේ ද? .

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

03. නිලධාරියා සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේ ද? ඔව් / නැත

04. පිළිතුර **"ඔව්"** නම් ලබාගත් වැටුප් රහිත නිවාඩු ගණන කොපමණ ද?

| *අනු. අංකය* | *නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසිය* | *කාල සීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| i. | ආයතන සංග්‍රහයේ < V:2:5:4 | | |
| ii. | ආයතන සංග්‍රහයේ< XII:16 | | |
| iii. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 10 | | |
| iv. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 33 | | |
| v. | ආයතන සංග්‍රහයේ<XII:36 | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | |

මෙම දෙපාර්තමේන්තුවේ ........................................................................................................ තනතුර දරන ....................
........................................................මයාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ......................................

........................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව.

07-41

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියේ උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වන ශ්‍රේණියේ පහත සඳහන් උපදේශක තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ උපදෙස් මත විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026 ජූලි මස 31 වේ.

<u>**පුරප්පාඩු පවතින ක්ෂේත්‍ර**</u>

| *අනු. අංකය* | *තනතුර* | *මාධ්‍යය* |
|---|---|---|
| 01. | උපදේශක (කාර්මික චිත්‍ර) | සිංහල |
| 02. | උපදේශක (කාර්මික චිත්‍ර) | දෙමළ |
| 03. | උපදේශක (කෘෂිකර්ම) | සිංහල |
| 04. | උපදේශක (කෘෂිකර්ම) | දෙමළ |
| 05. | උපදේශක (තොරතුරු තාක්ෂණය) | සිංහල |
| 06. | උපදේශක (මෝටර් යාන්ත්‍රික) | සිංහල |
| 07. | උපදේශක (මෝටර් යාන්ත්‍රික) | දෙමළ |
| 08. | උපදේශක (ශීතකරණ හා වායු සමන) | සිංහල |
| 09. | උපදේශක (ශීතකරණ හා වායු සමන) | දෙමළ |
| 10. | උපදේශක (විදුලි) | සිංහල |
| 11. | උපදේශක (විදුලි) | දෙමළ |
| 12. | උපදේශක (ලෝහ වැඩ) | සිංහල |
| 13. | උපදේශක (ලෝහ වැඩ) | දෙමළ |
| 14. | උපදේශක (ගොඩනැගිලි) | සිංහල |
| 15. | උපදේශක (ගොඩනැගිලි) | දෙමළ |

***1.0.** බඳවා ගැනීමේ ක්‍රමය :*

**1.1** විදුලි, ලෝහ වැඩ, කාර්මික චිත්‍ර, මෝටර් යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමන සහ ගොඩනැගිලි යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයක් හා වෘත්තීය පරීක්ෂණයක් මඟින් බඳවාගනු ලැබේ.

**1.2** එහිදී ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් ද වෘත්තීය පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන වෘත්තීය පරීක්ෂණ මණ්ඩලයක් විසින් ද පවත්වනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අභියෝග්‍යතාව, සාමාන්‍ය දැනීම හා වෘත්තීය පරීක්ෂණයේ ලකුණු සඳහා පිළිවෙළින් 1:1:1 අනුපාතයට බර තැබීම මත ලිඛිත විභාගයට හා ප්‍රායෝගික පරීක්ෂණයට වෙන වෙනම 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළින් පුරප්පාඩු සංඛ්‍යාව මත ලැයිස්තුගත කර විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**1.3** ඉන් අනතුරුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලකුණුවල එකතුව අනුව කුසලතා අනුපිළිවෙළින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් වේ.

**1.4** ඉහත අංක 1.1 හි සඳහන් ක්ෂේත්‍රවලට අයත් නොවන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සහ තොරතුරු තාක්ෂණ උපදේශක තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයකින් පමණක් බඳවාගනු ලැබේ. ලිඛිත විභාගයේ ලකුණුවල එකතුව මත 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළින් ලැයිස්තුගත කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**1.5** අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන සංඛ්‍යාව අදාළ තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**1.6**. උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් සීමිත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ.

**1.7.** සමත් ලකුණු ප්‍රමාණය සහිත අයදුම්කරුවන් සීමිත/විවෘත ක්‍රමයන් යටතේ වූ නියමිත බඳවා ගැනීමේ උපරිම ප්‍රතිශතය සම්පූර්ණ කර නොමැති නම් අනෙක් බඳවා ගැනීමේ ධාරාවෙන් තෝරා ගැනීම තුළින් අනුමත පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට කටයුතු කරනු ලැබේ.

**1.8** පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

***2.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :***

**2.1** රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/29 දරන සහ 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසි සහ **ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (III ශ්‍රේණියේ උපදේශක සේවා ගණය සඳහා වූ) 2020.07.06 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සහ ඒවාට දැනට කර ඇති හා මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් මෙම තනතුරට පත් කරනු ලැබේ**

**2.2** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

**2.3** මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 11.3 වගන්තිය අනුව වසර 01 වැඩබැලීමේ කාලයකට යටත් වේ. පත්වීම ලබන නිලධාරීන් වසර 03ක් ඇතුළත I වන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු ය.

**2.4** සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා සියලුම නිලධාරීන් වෘත්තීය තාක්ෂණ විද්‍යාලයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළ විශ්වවිද්‍යාලයකින් හෝ දෙපාර්තමේන්තුව මඟින් හෝ පවත්වනු ලබන ඉගැන්වීමේ / පුහුණු කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පැය 300 ක පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු අතර පත්වීම් ස්ථිර කිරීම සඳහා මෙම පුහුණු සහතික ලබා තිබිය යුතුය.

**2.5** ශ්‍රේණියට බඳවා ගන්නා සියලුම නිලධාරීන් සේවාගත කිරීමට පෙර අවම වශයෙන් සති හතරක (04) (පැය 160 ක) මූලික ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳව පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. එහිදී පුහුණු කාලය අවසානයේ නිලධාරියාගේ ඉගැන්වීමේ හැකියාව ඇගයීමට ලක්කර සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

**2.6** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව වසර 05ක් තුළදී දෙවන භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතුය.

**2.7** රාජ්‍ය භාෂාව තෙවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාසකාලය තුළ ලබා ගත යුතු ය.

**2.8** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**2.9** නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ / කාර්මික විද්‍යාලයක වුව ද සේවය කළ යුතුය.

**2.10** තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත්වන හෝ මඟ හරින පත්වීම්ලාභියකුගේ පත්වීම අවලංගු කරනු ලැබිය හැකිය.

***3.0. වැටුප් හා දීමනා :***

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL – 1 – 2025 වැටුප් ඛණ්ඩය යටතේ මෙම තනතුරට රු. 82,150 - 10 x 2400 – 8 x 2940– 17 x 3900 – රු. 1,95,970/- ක මාසික වැටුප් පරිමාණය හිමිය. එම චක්‍රලේඛයේ උපලේඛන IIහි සඳහන් පරිදි වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***4.0. බඳවා ගැනීමේ සුදුසුකම් :***

**4.1 සාමාන්‍ය සුදුසුකම්.**

**සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණකර තිබිය යුතු ය.**

**4.1.1.** ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

**4.1.2.** යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

4.2. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ;

| *අනු. අංකය* | *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|
| 01 | * විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින්, අයදුම්කරන විෂය ක්ෂේත්‍රය ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් ලබා තිබීම. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ MT-1-2025 වැටුප් පරිමාණය හිමි ශිල්ප ප්‍රදර්ශක, ගොවිපල කළමනාකරු තනතුරක හෝ MT-2-2025 වැටුප් පරිමාණය හිමි රසායනාගාර සහකාර තනතුරක නියමිත අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, වසර 05ක සක්‍රීය හා සතුටුදායක පළපුරුද්දක් ලබා තිබීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවMN-6-2025 වැටුප් පරිමාණය හිමි ඇගයීම් නිලධාරී තනතුරක අයදුම්කරන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නියමිත අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, වසර 03 ක සක්‍රීය හා සතුටුදායක පළපුරුද්ද ලබා තිබීම. |
| | *හෝ* | |
| 02 | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් අයදුම්කරන විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් 06 වන මට්ටමේ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ MT-1-2025 වැටුප් පරිමාණය හිමි ශිල්ප ප්‍රදර්ශක, ගොවිපළ කළමනාකරු තනතුරක හෝ MT-2-2025 වැටුප් පරිමාණය හිමි රසායනාගාර සහකාර තනතුරක නියමිත අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, වසර 07 ක සක්‍රීය හා සතුටුදායක පළපුරුද්දක් ලබා තිබීම; |
| | *හෝ* | |
| 03 | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් අයදුම්කරන විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටමේ හෝ සමාන මට්ටමේ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ MN-1-2025 වැටුප් පරිමාණය හිමි පරිශ්‍ර පාලක, කෘෂි කොන්දොස්තර, වැඩහල් සහකාර තනතුරක අයදුම්කරන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නියමිත අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, වසර 10 ක සක්‍රීය හා සතුටුදායක පළපුරුද්දක් ලබා තිබීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව MT-1-2025 වැටුප් පරිමාණය හිමි ශිල්ප ප්‍රදර්ශක, ගොවිපල කළමනාකරු තනතුරක හෝ MT-2-2025 වැටුප් පරිමාණය හිමි රසායනාගාර සහකාර තනතුරක නියමිත අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, වසර 09 ක සක්‍රීය හා සතුටුදායක පළපුරුද්ද ලබා තිබීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව MN-7-2025 වැටුප් පරිමාණය හිමි ශිල්ප ප්‍රදර්ශක (අධිපන්තිය) තනතුර දරන නිලධාරියකු වීම. |

***5.0 විභාග ගාස්තු:***

විභාග ගාස්තුව රු 600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය .

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
II. අන්තර්ජාල ගෙවීම පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions);
III. ලංකා බැංකුවේ මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon);
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන .-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

**6.0.අයදුම් කිරීමේ ක්‍රමය:**

**6.1** අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services " යටතේ ඇති "Online Applications Recruitment Exams/E.B. Exams"ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි.

**6.2.** මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 06 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 ජූලි මස 31 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ .

**6.3.** නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**6.4.** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් /අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය.විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

***7.0 විභාග ප්‍රවේශය :***

**7.1** විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් / කාරියන් හට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

**7.2** විභාග අපේක්ෂකයා තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය.

**7.3** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන.-* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

***8.0 විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය:***

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*සටහන.-*

i. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

ii. තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

### *9.0. අපේක්ෂකයාගේ අනන්‍යතාව:*

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාවතුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ .

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථකර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

### 10.0. *සාවද්‍ය තොරතුරු සැපයීමට පනවන දඬුවම් :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පැවැත්වෙන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු විසින් සාවද්‍ය බව දැන දැනම තොරතුරු ඉදිරිපත්කර ඇති බව හෝ යම් වැදගත් තොරතුරක් ඕනෑකමින් යටපත්කර ඇති බව අනාවරණය වුවහොත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත්වනු ලැබේ.

### *11.0 ලිඛිත විභාගය :*

විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත්කර ඇති සියලුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. විෂය නිර්දේශය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විතය.

විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පමණක් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

### *11.1. විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාව | සංඛ්‍යාත්මක හැකියාව තර්කානුකූලව කරුණු දැක්වීම බුද්ධිමය, දැනුම පරීක්ෂා කිරීම තුළින් සේවයේ රාජකාරි කටයුතු සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීම අරමුණු කොට මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජීය, සංස්කෘතික සහ ආර්ථික පරිසරය ද ඇතුළුව සුරක්ෂිතතාව සහ සම්මත ප්‍රමිතීන් ද ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනය පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම අරමුණුකර සම්පාදනය කරන මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකි. |

### *12.0. වෘත්තීය පරීක්ෂණය :*

විදුලි, ලෝහ වැඩ, මෝටර් යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමන, ගොඩනැගිලි, කාර්මික චිත්‍ර යන වෘත්තීයන් ආශ්‍රිත විෂයය ක්ෂේත්‍රයන් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ඒ ඒ විෂයය ක්ෂේත්‍රයෙහි වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

ලකුණු 100 කාලය – උපරිම පැය 06 යි.

### *12.1. විභාගය පිළිබඳ විස්තරය :*

| පරීක්ෂණය | විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | 1 ගොඩනැගිලි වෘත්තීය | උපරිම පැය 06 | 100 |
| | 2. කාර්මික චිත්‍ර | | |
| | 3.මෝටර් යාන්ත්‍රික | | |
| | 4. ශීතකරණ හා වායු සමන | | |
| | 5. විදුලි | | |
| | 6. ලෝහ වැඩ | | |

*12.2. වෘත්තීය පරීක්ෂණය සඳහා අදාළ වෘත්තීය ක්ෂේත්‍ර හා විෂය නිර්දේශය :*

| *විෂය ක්ෂේත්‍ර* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. ගොඩනැගිලි වෘත්තීය | මෙම වෘත්තීය පරීක්ෂණ තාක්ෂණ/කාර්මික විද්‍යාල දැනට පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ (NVQ – 5) පාඨමාලාවල ප්‍රායෝගික පරීක්ෂණයට සමාන මට්ටමකින් පැවැත්වෙනු ඇත. මෙහිදී අපේක්ෂකයා තම තාක්ෂණික දැනුමට අදාළ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකරවීමටත්, මෙවලම් හඳුනාගැනීමට හා පරිහරණය කිරීමටත් එම උපකරණ, මෙවලම් භාවිතයෙන් සිසුන්ට තම ශිල්පීය දක්ෂතාව ප්‍රදර්ශනය කර අවබෝධය ලබා දීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. |
| 2.කාර්මික චිත්‍ර | |
| 3. මෝටර් යාන්ත්‍රික | |
| 4. ශීතකරණ හා වායු සමන | |
| 5. විදුලි | |
| 6. ලෝහ වැඩ | |

*13.0 සම්මුඛ පරීක්ෂණය :*

තරග විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

***14.0*** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති සහ මෙම *ගැසට්* පත්‍රයේ 3 වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 2183/20 හා 2020.07.06 දිනැති අතිවිශේෂ *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලද "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය" කෙරෙහි සහ එහි සංශෝධන කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමුකරවනු ලැබේ. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 තෙක් ඡේදයන්හි වගන්ති තනතුරට ගැළපෙන පරිදි අදාළ වේ.

***15.0*** අනුමත පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

***16.0*** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**අධ්‍යාපන , උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියේ**
**උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය (සීමිත) - 2026**

| අයදුම්කරන තනතුර | තනතුරු අංකය | විභාගයට අයදුම්කරන භාෂා මාධ්‍ය |
|---|---|---|
| | | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : - | | | | | | | | | | | | | | | |

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA A. B.

02. සම්පූර්ණ නම ..........................................................................................................
..........................................................................................................

03. (අ) රාජකාරි ලිපිනය ............................................................................................................................................
.................................................................................................................................................................................
(ආ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) ............................................................................................
.................................................................................................................................................................................
(ඇ) පෞද්ගලික දුරකථන අංක ............................................................

04. (අ) ඔබ ශ්‍රී ලාංකිකයකු ද යන වග - ඔව් ☐ නැත ☐

05. ස්ත්‍රී/පුරුෂ භාවය - ..........................................

06. (අ). උපන් දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ). ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස

අවුරුදු ☐☐ මාස - ☐☐ දින- ☐☐

08. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :-

(අ) තනතුර හා පත්වීමේ දිනය :-

(ආ) තනතුර ස්ථිර ද තාවකාලික ද යන වග :-

(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :-

(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත්ද යන වග :-

(ඉ) දෙපාර්තමේන්තුව :-

(ඊ) සේවා ස්ථානය :-

**09. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීනතාවය පිළිබඳ සහතික ද ඇතුළුව)**

| *සමත් වූ විභාගය* | *විශ්වවිද්‍යාලය / ආයතනය* | *සමත් වර්ෂය* | *විෂය ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

**10. ඉගැන්වීම හා / හෝ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :-**
(*අදාළ සහතිකවල සහතික පිටපත් ඇමිණිය යුතු ය.*)

**11. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කලින් දරන ලද තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න):-**

| *ඉගැන්වීම / සේවය කළ ආයතනයේ නම* | *තනතුර* | *ලබාගත් සහතික* | *කාලසීමාව* | *විෂය ක්ෂේත්‍රය / වෘත්තීය ක්ෂේත්‍රය* |
|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | |

| *දෙපාර්තමේන්තුව / ආයතනය* | *සේවා ස්ථානය* | *තනතුර* | *ස්ථිර ද, තාවකාලික ද යන වග* | *සිට* | *තෙක්* | *සේවා කාලය* |
|---|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | | | |

**12**. **ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද?** ඔව් / නැත
එසේ නම් විස්තර දක්වන්න:- ..........................................................................................................................................
..........................................................................................................................................

13. **මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ ද ?**
ඔව් / නැත - එසේ නම් සේවයෙන් ඉවත්වීමට / ඉවත් කිරීමට හේතුව දක්වන්න **:-**
..........................................................................................................................................

**14. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද?** ඔව් / නැත.
එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න **:-**
..........................................................................................................................................

මා විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසිදු වන්දියක් නොලබා මා තනතුරින් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

..............................................
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය **:-**

**<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ</u> සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන් / අධ්‍යක්ෂ / විදුහල්පතිගේ නිර්දේශය**

ඉහත අයදුම්කරු සම්බන්ධයෙන් වූ අනු අංක 01 සිට 13 තෙක් සඳහන් තොරතුරු නිවැරදි බවත් නිවැරදි විභාග ගාස්තු ගෙවා ඇති බවත් සහතික කරමි.
ඉහත නිලධාරියා මා ඉදිරියේදී අත්සන් කළ බවත් සහතික කරමි.

.............................................................................
දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන් / අධ්‍යක්ෂ / විදුහල්පතිගේ අත්සන

දිනය :-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත විස්තර සඳහන් ........................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත්,ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට සේවයේ යෙදී සිටින තනතුරෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

නම:
පදවි නාමය:
ලිපිනය:
දිනය:
නිල මුද්‍රාව:

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :-

07-46/2

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියේ උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2026***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වන ශ්‍රේණියේ පහත සඳහන් උපදේශක තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹදී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ උපදෙස් මත විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026 ජූලි මස 31 වේ.

**පුරප්පාඩු පවතින ක්ෂේත්‍ර**

| *අනු අංකය* | *තනතුර* | *මාධ්‍යය* |
|---|---|---|
| 01. | උපදේශක (කාර්මික චිත්‍ර) | සිංහල |
| 02. | උපදේශක (කාර්මික චිත්‍ර) | දෙමළ |
| 03. | උපදේශක (කෘෂිකර්ම) | සිංහල |
| 04. | උපදේශක (කෘෂිකර්ම) | දෙමළ |
| 05. | උපදේශක (තොරතුරු තාක්ෂණය) | සිංහල |
| 06. | උපදේශක (මෝටර් යාන්ත්‍රික) | සිංහල |
| 07. | උපදේශක (මෝටර් යාන්ත්‍රික) | දෙමළ |
| 08. | උපදේශක (ශීතකරණ හා වායු සමන) | සිංහල |
| 09. | උපදේශක (ශීතකරණ හා වායු සමන) | දෙමළ |
| 10. | උපදේශක (විදුලි) | සිංහල |
| 11. | උපදේශක (විදුලි) | දෙමළ |
| 12. | උපදේශක (ලෝහ වැඩ) | සිංහල |
| 13. | උපදේශක (ලෝහ වැඩ) | දෙමළ |
| 14. | උපදේශක (ගොඩනැගිලි) | සිංහල |
| 15. | උපදේශක (ගොඩනැගිලි) | දෙමළ |

*1.0 බඳවා ගැනීමේ ක්‍රමය :*

**1.1** විදුලි, ලෝහ වැඩ, කාර්මික චිත්‍ර, මෝටර් යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමනය, ගොඩනැගිලි, යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.

**1.2** එහිදී ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් ද වෘත්තීය පරීක්ෂණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන වෘත්තීය පරීක්ෂණ මණ්ඩලයක් විසින් ද පවත්වනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අභියෝග්‍යතාව, සාමාන්‍ය දැනීම හා වෘත්තීය පරීක්ෂණයේ ලකුණු සඳහා පිළිවෙළින් 1:1:1 අනුපාතයට බර තැබීම මත ලිඛිත විභාගයට හා ප්‍රායෝගික පරීක්ෂණයට වෙන වෙනම 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළින් පුරප්පාඩු සංඛ්‍යාව මත ලැයිස්තුගත කර විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**1.3** ඉන් අනතුරුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ, ලිඛිත විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලකුණුවල එකතුව අනුව කුසලතා අනුපිළිවෙළින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් වේ.

**1.4** ඉහත අංක 1.1 හි සඳහන් ක්ෂේත්‍රවලට අයත් නොවන කෘෂිකර්මය ක්ෂේත්‍රය සහ තොරතුරු තාක්ෂණය යන උපදේශක තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ලකුණුවල එකතුව අනුව 40%හෝ ඊට වඩා වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ ලැයිස්තු ගත කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත කැඳවනු ලැබේ.

**1.5** අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන සංඛ්‍යාව අදාළ තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**1.6** උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක් විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ.

**1.7** සමත් ලකුණු ප්‍රමාණය සහිත අයදුම්කරුවන් සීමිත/විවෘත ක්‍රමයන් යටතේ වූ නියමිත බඳවා ගැනීමේ උපරිම ප්‍රතිශතය සම්පූර්ණ කර නොමැති නම් අනෙක් බඳවා ගැනීමේ ධාරාවෙන් තෝරා ගැනීම තුළින් අනුමත පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට කටයුතු කරනු ලැබේ.

**1.8**. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

***2.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :***

**2.1** රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/29 දරන සහ 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසි සහ **ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (III ශ්‍රේණියේ උපදේශක සේවා ගණය සඳහා වූ) 2020.07.06 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සහ ඒවාට දැනට කර ඇති හා මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් මෙම තනතුරට පත් කරනු ලැබේ.**

**2.2**. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට පත්වීම්ලාභියා යටත් විය යුතු ය. තව ද පත්වීම්ලාභියා විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට පත්වීම්ලාභියා ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

**2.3** මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

**2.4** සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා සියලුම නිලධාරීන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළ විශ්වවිද්‍යාලයකින් හෝ දෙපාර්තමේන්තුව මගින් හෝ පවත්වනු ලබන ඉගැන්වීමේ / පුහුණු කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පැය 300 ක පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු අතර පත්වීම් ස්ථිර කිරීම සඳහා මෙම පුහුණු සහතික ලබා තිබිය යුතු ය.

**2.5** III ශ්‍රේණියට බඳවා ගන්නා සියලුම නිලධාරින් සේවාගත කිරීමට පෙර අවම වශයෙන් සති හතරක (04) (පැය 160 ක) මූලික ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳව පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. එහිදී පුහුණු කාලය අවසානයේ නිලධාරියාගේ ඉගැන්වීමේ හැකියාව ඇගයීමට ලක්කර සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

**2.6** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව වසර 05ක් තුළදී දෙවන භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතුය.

**2.7** රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරින් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගතයුතුය.

**2.8** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**2.9** නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ / කාර්මික විද්‍යාලයක සේවය කිරීමට බැඳී සිටි.

**2.10**. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හෝ මඟ හරින පත්වීම්ලාභියකුගේ පත්වීම අවලංගු කරනු ලැබිය හැකිය.

***3.0 වැටුප් හා දීමනා :***

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL – 1 – 2025 වැටුප් ඛණ්ඩය යටතේ මෙම තනතුරට රු. 82,150 - 10 x 2400 – 8 x 2940 – 17 x 3900– රු. 1,95,970/- ක මාසික වැටුප් පරිමාණය හිමිය. එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුපෙහි පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජය විසින් කලින් කල ගෙවනු ලබන වෙනත් දීමනා ද මෙම තනතුර දරන්නාට හිමිවනු ඇත.

***4.0. බඳවාගැනීමේ සුදුසුකම් :***

**4.1 සාමාන්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

**4.1.1** ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

**4.1.2** විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

**4.1.3** ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවු. 21ට නොඅඩු හා අවු. 40ට නො වැඩි විය යුතුය.

**4.1.4**. යම් ආගමක/ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු නොවිය යුතුය.

**4.1.5.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල v වැනි පරිච්ඡේදයේ සඳහන් එකදු නුසුදුසුකමකින් හෝ පෙළෙන්නකු නොවිය යුතුය.

**4.1.6.** ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුතු අයකු විය යුතුය.

**4.2 .අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

| *අනු. අංකය* | *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|
| 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින්, අයදුම් කරන විෂය ක්ෂේත්‍රය ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළ NVQ 7 මට්ටමට සමාන SLQF 5 මට්ටම ලබා තිබීම. | නියමිත අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව, රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක හෝ සමාගම්පනත යටතේ හෝ ආයෝජන මණ්ඩලයේ හෝ ලියාපදිංචි වී ඇති අධ්‍යාපන/ පුහුණු ආයතනයක අයදුම්කරන විෂය ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක හෝ සමාගම් පනත යටතේ හෝ ආයෝජන මණ්ඩලයේ හෝ ලියාපදිංචි වී ඇති කර්මාන්ත ශාලාවක අයදුම්කරන විෂය ක්ෂේත්‍රය සම්බන්ධ තනතුරක වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම හෝ ඉහත දෙයාකාරයෙන්ම වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. |

***05. විභාග ගාස්තු:***

විභාග ගාස්තුව රු.600 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය .

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
II. අන්තර්ජාල ගෙවීම පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions);
III. ලංකා බැංකුවේ මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon);
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන* -

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

***6.0 අයදුම් කිරීමේ ක්‍රමය:***

**6.1** අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services " යටතේ ඇති "Online Applications Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි.

**6.2.** මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 06 වැනි දින පෙ.ව.09.00ට විවෘත වන අතර 2026 ජූලි මස 31 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.**

**6.3.**දැනට රාජ්‍ය/ පළාත් සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**6.4** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් /අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

***7.0 විභාග ප්‍රවේශය:***

**7.1** සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් හට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

**7.2** විභාග අපේක්ෂකයා තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

**7.3** සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

***8.0 විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය***

විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*සටහන -*

(i.) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii.) තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

***9.0. අපේක්ෂකයාගේ අනන්‍යතාව:***

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

***10.0 සාවද්‍ය තොරතුරු සැපයීම :***

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පැවැත්වෙන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු විසින් සාවද්‍ය බව දැන දැනම තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් තොරතුරක් ඕනෑකමින් යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත්වනු ලැබේ.

***11.0 ලිඛිත විභාගය:***

විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇති සියලුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

***11.1 ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය :-***

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1.අභියෝග්‍යතාව | සංඛ්‍යාත්මක හැකියාව තර්කානුකූලව කරුණු දැක්වීම සහ බුද්ධිමය දැනුම පරීක්ෂා කිරීම තුළින් සේවයේ රාජකාරී කටයුතු සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීම අරමුණු කොට මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| 2.සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජීය, සංස්කෘතික සහ ආර්ථික පරිසරය ද ඇතුළුව සුරක්ෂිතතාව සහ සම්මත ප්‍රමිතීන් ද ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනය පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම අරමුණු කර සම්පාදනය කරන මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකි. |

***12.0 වෘත්තීය පරීක්ෂණය :***

විදුලි, ලෝහ වැඩ, මෝටර් යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමන, ගොඩනැගිලි, කාර්මික චිත්‍ර ක්ෂේත්‍රයන් සඳහා අයදුම් කරන

අයදුම්කරුවන් අතුරින් ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ඒ ඒ විෂයය ක්ෂේත්‍රයෙහි වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

ලකුණු 100 කාලය – උපරිම පැය 06 යි

**12.1.** විභාගය පිළිබඳ විස්තරය :

| *පරීක්ෂණය* | *විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | 1.කාර්මික චිත්‍ර | උපරිම පැය 06 | 100 |
| | 2.ගොඩනැගිලි වෘත්තිය | | |
| | 3.මෝටර් යාන්ත්‍රික | | |
| | 4. ශීතකරණ හා වායු සමන | | |
| | 5. විදුලි | | |
| | 6. ලෝහ වැඩ | | |

**12.2.** වෘත්තීය පරීක්ෂණය සඳහා අදාළ වෘත්තීය ක්ෂේත්‍ර හා විෂය නිර්දේශය :

| *විෂය ක්ෂේත්‍ර* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. කාර්මික චිත්‍ර | මෙම වෘත්තීය පරීක්ෂණ තාක්ෂණ / කාර්මික විද්‍යාල දැනට පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ (NVQ – 5) පාඨමාලාවල ප්‍රායෝගික පරීක්ෂණයට සමාන මට්ටමකින් පැවැත්වෙනු ඇත.<br><br>මෙහිදී අපේක්ෂකයා තම තාක්ෂණික දැනුමට අදාළ යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීමටත්, මෙවලම් හඳුනාගැනීමට හා පරිහරණය කිරීමටත් එම උපකරණ, මෙවලම් භාවිතයෙන් සිසුන්ට තම ශිල්පීය දක්ෂතාව ප්‍රදර්ශනය කර අවබෝධය ලබා දීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. |
| 2. ගොඩනැගිලි වෘත්තිය | |
| 3. මෝටර් යාන්ත්‍රික | |
| 4. ශීතකරණ හා වායු සමන | |
| 5. විදුලි | |
| 6. ලෝහ වැඩ | |

13.0 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

තරග විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

**14.0.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති සහ මෙම *ගැසට්* පත්‍රයේ 3 වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 2183/20 හා 2020.07.06 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලද "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය" සහ එහි 1-වන සංශෝධනය කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 තෙක් ඡේදයන්හි වගන්ති තනතුරට ගැළපෙන පරිදි අදාළ වේ.

**15.0.** අනුමත පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**16.0.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**අධ්‍යාපන , උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියේ**
**උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය (විවෘත) - 2026**

| *අයදුම්කරන තනතුර* | *තනතුරු අංකය* | *විභාගයට අයදුම්කරන භාෂා මාධ්‍ය* |
|---|---|---|
| | | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : - | | | | | | | | | | | | | | | |

ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA A. B.

02. සම්පූර්ණ නම : ............................................................................................................................................................

03. (අ) රාජකාරි ලිපිනය : ............................................................................................................................................................

(ආ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) : ............................................................................................................................................................

(ඇ) පෞද්ගලික දුරකථන අංක : ............................................................

04. (අ) ඔබ ශ්‍රී ලාංකිකයකු ද යන වග : ඔව් ☐ නැත ☐

05. ස්ත්‍රී/පුරුෂභාවය : ..........................................

06. (අ) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

08. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීණතාවය පිළිබඳ සහතික ද ඇතුළුව)

| *සමත් වූ විභාගය* | *විශ්වවිද්‍යාලය / ආයතනය* | *සමත් වර්ෂය* | *විෂයය ක්ෂේත්‍රය* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | |

09. ඉගැන්වීම හා / හෝ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *ඉගැන්වීම / සේවය කළ ආයතනයේ නම* | *තනතුර* | *ලබාගත් සහතික* | *කාලසීමාව* | *විෂය ක්ෂේත්‍රය / වෘත්තීය ක්ෂේත්‍රය* |
|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | |

**10.** කලින් දරන ලද තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න) :

| *දෙපාර්තමේන්තුව / ආයතනය* | *සේවා ස්ථානය* | *තනතුර* | *ස්ථිර ද, තාවකාලික ද යන වග* | *සිට* | *තෙක්* | *සේවා කාලය* |
|---|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | | | | | |

**11.** ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද? ඔව් / නැත **:**
එසේ නම් විස්තර දක්වන්න : ................................................................................................................................................
................................................................................................................................................

**12. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක/අධිකාරියක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ ද ?**
ඔව් / නැත. එසේ නම් සේවයෙන් ඉවත්වීමට / ඉවත් කිරීමට හේතුව දක්වන්න **:-**
................................................................................................................................................

**13. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද?** ඔව් / නැත.
එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න **:-**
................................................................................................................................................

**14. අයදුම්කරුගේ ප්‍රකාශය -:**

මා විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසිදු වන්දියක් නොලබා මා තනතුරින් පහකිරීමට යටත් වන බව ද මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

..............................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය **:**

---

**15. අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :**

මෙම ඉල්ලුම්පත්‍රය ඉල්ලුම්කරන ........................................................................................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ......................................................දින ඔහුගේ /ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බව මෙයින් සහතික කරමි.

..............................................
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ...................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :- ..........................................................................................................
තනතුර : ................................................................................................................................................
ලිපිනය : ................................................................................................................................................
නිල මුද්‍රාව:

**දැනට රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි :**

ඉහත විස්තර සඳහන් ...............................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත්,ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

............................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

තනතුර :

දිනය : නිල මුද්‍රාව :

07-46/1

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) 2026 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

**2025 වර්ෂයේ හෝ ඊට පෙර** අ.පො.ස (උසස් පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරන පිළිවෙල**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා **apply.sliate.ac.lk** වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගතව අයදුම්කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. අයදුම්කරුවන් අන්තර්ජාලය හරහා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේදී මෙන්ම අන්තර්ජාලය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී ඇතුළත් වීමේ මාර්ගෝපදේශ කියවා තේරුම් ගත යුතු අතර, එහි ඇති නීති රීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතුය. ඇතුළත් වීමේ මාර්ගෝපදේශය මාර්ගගත අයදුම්පත සමඟ ලබා ගත හැක.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පහත වගුවේ පරිදි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා කාණ්ඩ දෙකක් යටතේ පිරිනමයි :

| | |
|---|---|
| **කාණ්ඩ - 1**<br>Z ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HNDA, HNDBA, HNDBF, HNDE (CIVIL), HNDE (MECHANICAL), HNDE (ELECTRICAL & ELECTRONICS)/ HNDQS, HNDBSE, HNDT(AGRICULTURE.), HNDFT |
| **කාණ්ඩ - 2**<br>ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HND IN ENGLISH, HNDIT, HNDM, HNDPM, HNDTHM |

සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට Z අගය මත පදනම් වූ සහ ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ පාඨමාලා කාණ්ඩ දෙකෙන්උපරිම අවස්ථා 10 ක් දක්වා ඔවුන්ගේ ප්‍රමුඛතාවය මත පදනම්ව උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සංයෝජන තෝරාගත හැක.

උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා වන ප්‍රවේශ සුදුසුකම් **"A"** කොටසේ සහ උසස් තාක්ෂණ ආයතන (**ATIs**) පිළිබඳ විස්තර **"B"** කොටසේ ඇතුලත් කර තිබේ.

සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට රු.1,000 ක් ගෙවා උසස් තාක්ෂණ ආයතන වල උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා (උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා සංයෝජන) උපරිම 10 ක් ඉහත කාණ්ඩ දෙකෙන්ම ඉල්ලුම් කළ හැක.

ඔබගේ බැංකු යෙදුමේ දැනටමත් පහසුකම් සපයා ඇති "Govpay" හරහා ගෙවීම් සිදු කළ හැක.

"Govpay" භාවිතයෙන් අයදුම්පත් ගාස්තුව ගෙවීම සිදු කරන ආකාරය :

1. ඔබගේ බැංකු යෙදුමට යන්න.
2. බිල්පත් ගෙවීම තෝරන්න
3. බිල්පත් ගෙවීම යටතේ “Govpay” කාණ්ඩය තෝරන්න
4. ආයතනයේ නම යටතේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය තෝරන්න.
5. සේවා වර්ගය යටතේ අයදුම්පත් ගාස්තුව තෝරන්න.
6. විස්තර පුරවා ඉදිරිපත් කරන්න.

"ගෙවීම සාර්ථකයි" ගෙවීම/රිසිට්පත ගණකාධිකාරී, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) ප්‍රධාන කාර්යාලයට govpay.accountant@sliate.ac.lk විද්‍යුත් තැපෑල හරහා යැවිය යුතුය.

බැංකු ගෙවීම් කුවිතාන්සියේ ගනුදෙනු යොමු අංකය (Transaction Reference Number) මාර්ගගත අයදුම්පතට ඇතුළත් කළ යුතුය.

**2026 අගෝස්තු 03 වන දින හෝ ඊට පෙර** දෙහිවල, මහජන බැංකුවේ හෝ ශ්‍රී ලංකාවේ මහජන බැංකුවේ වෙනත් ඕනෑම ශාඛාවක **SLIATE ගිණුම් අංකය 019100203397613** වෙත ගෙවීම් බැර කළ යුතුය.

මාර්ගගත අයදුම්පත තහවුරු කිරීමෙන් පසු, පද්ධතියෙන් ජනනය කරන ලද අයදුම්පතේ දෘඩ පිටපතක් ලබා ගන්න. ඉහත අයදුම්පතේ අත්සන් කළ පිටපතක් සහ ගෙවීම් කුවිතාන්සිය ලියාපදිංචි තැපෑලෙන් පළමු කැමති ATI වෙත යැවිය යුතුය.

සැකසීමේදී සහ පසුව අයදුම්පතේ තත්ත්වය ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය හෝ තැපෑලෙන් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.

**2026 අගෝස්තු 03 වන දින අවසන් දිනට පසු** ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

**පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :**

- **පූර්ණ කාලීන පාඨමාලා**
- **අර්ධ කාලීන පාඨමාලා (සති අන්ත)**

**ඉගැන්වීමේ මාධ්‍ය - ඉංග්‍රීසි**

අර්ධ කාලීන පාඨමාලා අදාල ක්ෂේත්‍රයන්හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් පවත්වනු ලැබේ.

**පාඨමාලා ගාස්තු :**

පූර්ණ කාලීන (Full-Time) පාඨමාලා ගාස්තු - නොමිලේ.

එක් අධ්‍යයන සමාසිකයක් වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව – HNDA
රු. 17,000.00

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව – HND in English
රු. 17,000.00

උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව – HNDIT
රු. 30,000.00

අර්ධකාලීන පාඨමාලා සඳහා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතු ගාස්තුව රු. 10,000.00

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදුකරන අවස්ථාවේ දී අවශ්‍ය අධ්‍යාපනික සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි වල මුල්පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළයුතුය.

**නේවාසිකාගාර පහසුකම් :**

පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනයන් හි ඉල්ලීම මත පමණක් පූර්ණ කාලීන සිසුන් සීමිත සංඛ්‍යාවක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

- **දෙහිවල සහ ගම්පහ උසස් තාක්ෂණ ආයතන -** සිසුවියන් සඳහා පමණක්
- **අම්පාර සහ කොළඹ උසස් තාක්ෂණ ආයතන -** සිසුන් සහ සිසුවියන් සඳහා

**උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා ඇතුළත් වීමේ ශිෂ්‍ය තේරීමේ ක්‍රියා පටිපාටිය - 2026 අධ්‍යයන වර්ෂය.**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (**SLIATE**) විසින් **2026** අධ්‍යයන වර්ෂය සඳහා පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (**HND**) පාඨමාලා සඳහා ඇතුළත් වීම **SLIATE** හි අදාළ බලධාරීන් විසින් අනුමත කරන ලද පහත සඳහන් තේරීම් නිර්ණායක සහ ක්‍රියා පටිපාටියට අනුකූලව සිදු කරනු ලැබේ.

**තේරීම් නිර්ණායක :-**

අයදුම්කරුවන් තෝරා ගැනීම පහත දක්වා ඇති අනුපිළිවෙලට පහත සඳහන් නිර්ණායක මත පදනම් වේ.

(අ) අයදුම්කරුවන් විසින් තමන් කැමති පාඨමාලාව පිරිනමනු ලබන තම ස්ථිර පදිංචියට ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත අයදුම් කිරීමට දිරිමත් කරනු ලැබේ. සිසුන් සහ ඔවුන්ගේ පවුල් විසින් දරනු ලබන නවාතැන්, ප්‍රවාහන සහ ජීවන වියදම් අවම කිරීම තුළින් පාඨමාලාව හැදෑරීමට දැරිය යුතු සමස්ත පිරිවැය අඩු වීම සහ සිසුන්ගේ ආරක්ෂාව වඩාත් සහතික වීම එමගින් අපේක්ෂා කරන අතර, තෝරාගත් පාඨමාලාව සාර්ථකව නිම කිරීමට එය හේතු වේ.

(ආ) අධ්‍යයන කුසලතා තීරණය කරනු ලබන්නේ අ.පො.ස. (උ.පෙළ) **Z**-ලකුණු මත පදනම්ව හෝ අදාල උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අනුමත ලකුණු දීමේ පටිපාටිය මත පදනම්ව වේ.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු විසිතුන **(23)** ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**“A” කොටස**

**උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා ප්‍රවේශ සුදුසුකම්**

**01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව** (HNDA)

**1.1 පූර්ණ කාලීන - වසර 4 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත්වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**1.2 අර්ධ කාලීන - වසර 4 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත්වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේදී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

*හෝ*

(ii) අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත් වීම.

*සහ*

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඇති ඕනෑම සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

A. ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව.
B. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය.
C. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය.
D. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**සටහන 1:**

පහත සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් ඇති **වාණිජ විෂය ධාරාවේ** ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා අර්ධ-කාලීන අයදුම්කරුවෙකු අනෙකුත් ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන්නේ නම් සහ උසස් තාක්ෂණ ආයතන වල ධාරිතාව තිබේ නම්, පළමු වසරෙන් නිදහස් කර දෙවන වසරට බඳවා ගනු ලැබේ.

i. SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

ii. කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් තිබීම.

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර්මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I සහ II) සම්පූර්ණ කිරීම.

iv. වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA – UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

v. සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCA-UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

vi. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

vii. සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA-Sri Lanka) විසින් පවත්වනු ලබන පළවන මට්ටම හා දෙවන මට්මමේ විභාග සමත්ව තිබීම.

**සටහන 2:**

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව, බඳවා ගැනීමේ පටිපාටියන්හි දී, උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි, පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.**

**02. උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව (HNDBA) පූර්ණ කාලීන - වසර 2 ½ ක්**

**03. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව (HNDBF) පූර්ණ කාලීන - 2 ½ ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

වාණිජ විෂය ධාරාව යටතේ එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාතිබීම.

**04. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) HNDE (Civil) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**05. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත් ) HNDE (Electrical and Electronics) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික)HNDE (Mechanical) පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**07. උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව HNDQS පූර්ණ කාලීන - වසර 2 ½ ක්**

**08. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව HNDBSE පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එකවර අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම. (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය)

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

**9.1 පූර්ණ කාලීන - වසර 2 ½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.)

*සහ*

(ii) අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම.

*හෝ*

**අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සඳහා සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම.**

**9.2 අර්ධ කාලීන - වසර 2½ යි.**

9.1 හි ඉහත සුදුසුකම් වලට අමතරව, අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුක්ත (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමාව (HNDFT) පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (HNDIT)**

**11.1 පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

**අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.**

**11.2 අර්ධ කාලීන - වසර 2½ යි.**

**11.1** හි ඉහත සුදුසුකම් වලට අමතරව, අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව (HNDM)**
**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය (රාජ්‍ය පරිපාලනය / අලෙවිකරණය).

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**13. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව (HNDPM)**
**පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවරක දී අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**14. උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT – Agriculture)**
**පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ජීව විද්‍යාව විෂය ධාරාවෙන් එකවර** අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.
(ජීව විද්‍යාව සහ රසයන විද්‍යාව සමඟ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය විෂයයන් ඇතුලත්ව)

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

(ii.) **ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් ඇතුලත්ව, ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)**
**පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

"B" කොටස

උසස් තාක්ෂණ ආයතනවල (ATIs) නම්, ලිපිනයන්, දුරකථන අංක සහ
උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා
[පූර්ණ කාලීන (FT) සහ අර්ධ කාලීන (PT) ]

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර. | 063-2222056<br>063-2223035 | HNDT (Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය, අනුරාධපුරය. | අක්කර 111, අනුලා මාවත, පන්ඩුලගම, අනුරාධපුරය. | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT),<br>HNDIT(PT) HNDA (PT), HND in English (PT) |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල. | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල. | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT (PT), HNDA (PT),HND in English (PT) |
| 04 | උසස් තාක්ෂණ ආයතනය, මඩකලපුව. | කෙලින් වීදිය, කෝවිල් කුලම්, නැගෙනහිර, ආරයම්පති, මඩකලපුව. | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT),<br>HND in English (FT), HNDA (PT),<br>HND in English (PT), HNDIT(PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ. | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ- 15. | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT), HNDE (Electrical & Electronics)(FT) HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල. | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDBF(FT), HNDTHM(FT),<br>HNDA (PT), HND in English (PT), |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල. | සිරිධම්ම මාවත, ලබුදුව, අක්මීමණ, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT), HNDE (Electrical & Electronics)(FT) HNDQS(FT), HNDIT (FT),<br>HNDT(Agriculture)(FT),<br>HNDA (FT), HNDM(FT), HNDTHM(FT),-<br>HNDBA(FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 08 | උසස් තාක්ෂණ ආයතනය, ගම්පහ. | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ. | 033-2287519<br>033-2292544 | HNDT (Agriculture) (FT), HNDIT (FT), HNDFT(FT),HNDA (FT), HNDA (PT), HNDIT (PT), HND in English(PT) |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය. | අංක 2/665, වෙරළ පාර, ගුරුනගර්, යාපනය. | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE (Electrical & Electronics)(FT), HNDA (FT), HND in English (FT), HNDM (FT), HNDIT (FT), HNDIT (PT), HNDA (PT) , HND in English (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර. | අංක. 16, කැප්පෙටිපොළ මාවත, මහනුවර. | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT), HNDA (PT),HND in English (PT), HNDIT (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල. | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English(FT), HNDPM(FT) HNDA (PT), HND in English (PT) |
| 12 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල. | 1/22, විල්ගොඩ පාර, කුරුණෑගල. | 037-2229583<br>037-2224911 | HNDIT(FT),HNDA(FT),HNDM(FT), HND in English (FT), HNDTHM(FT) HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 13 | උසස් තාක්ෂණ ආයතනය, මන්නාරම. | උයිලන්කුලම මන්නාරම. | 023-3122555<br>076-7966111 | HND in English (FT), HNDIT (FT), HND in English (PT) HNDIT (PT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය, නාවලපිටිය. | හයින්ෆෝඩ් වත්ත මානාකන්ද නාවලපිටිය. | 077-6594248 | HNDTHM(FT), HNDM(FT), HNDBF (FT) HND in English (FT), HNDIT (FT), HND in English (PT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය, රත්නපුරය. | නව නගරය, රත්නපුරය. | 045-2231492<br>045-2231493 | HNDIT(FT),HNDA(FT), HNDA (PT), HND in English (FT), HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය, සමන්තුරය. | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරය. | 067-2261304 | HNDIT (FT),HNDA (FT), HND in English (FT), HNDIT (PT),HNDA (PT), HND in English (PT) |
| 17 | උසස් තාක්ෂණ ආයතනය, තංගල්ල. | යාය වත්ත, නොටොල්පිටිය, තංගල්ල. | 047-2241845<br>047-2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 18 | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය. | කන්නියා පාර, වරෝතය නගර්, ත්‍රිකුණාමලය. | 026-2223232 | HNDIT (FT), HNDA (FT), HND in English (FT),<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය, වවුනියාව. | A9 පාර වෙප්පන්තුලම ඔමන්තෙයි, වවුනියාව. | 024-2052733<br>077-6162010 | HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT (PT), HNDIT (FT) |

**සටහන:**

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවතින උසස් තාක්‍ෂණ ආයතන මගින් පවත්වනු ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත (වරින්වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලබයි.

    **වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා**

    (i) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව – (HNDA)
    (ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) HNDE (Civil)
    (iii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (විදුලි හා විද්‍යුත් ) HNDE (Electrical & Electronics)
    (iv) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා පාඨමාලාව (යාන්ත්‍රික) HNDE (Mechanical)
    (v) උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (HNDBSE)
    (vi) උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT – Agriculture)
    (vii) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDM)
    (viii) උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)

03. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීමේ දී වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එමෙන්ම, 2025 වර්ෂයේ අ.පො.ස.(උ:පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

04. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා, එම අධ්‍යයන පාඨමාලාවට අවම වශයෙන් සිසුන් 50 ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන් එම පාඨමාලාවම පවත්වනු ලබන ආසන්නම උසස් තාක්ෂණ ආයතනය වෙත ස්ථාන මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය අවසාන තීරණය වේ.

05. සියලුම පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල ද දේශන සඳහා සහභාගී විය යුතුය.

06. අර්ධකාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.

07. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ ප්‍රධාන වශයෙන් දේශනශාලාගතව (පන්ති මට්ටමින්) වේ. කෙසේ වෙතත් අවශ්‍යතාවය අනුව පන්ති කාමර තුළ දේශන පැවැත්වීම මෙන්ම මාර්ගගතව දේශන පැවැත්වීම ද සිදු කරනු ලැබේ.

08. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහා වන දේශන සති අන්තයේ දී පැවැත්වේ.

09. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06 ක කාලයක් අදාල ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත යුතුය. අර්ධකාලීන සිසුන් අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස 6 ක ව්‍යාපෘතියක්/ කර්මාන්ත පුහුණුවක් ලබාගත යුතුය.

10. අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.

11. **යම් සිසුවෙකු පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරාගැනීමෙන් පසුව වෙනත් කිසිදු උසස් තාක්ෂණ ආයතනයක් වෙත කිසිදු හේතුවක් මත ස්ථාන මාරු කරනු නොලැබේ.**

12. ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට කිසිදු ගාස්තුවකින් තොරව අදාල ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට දින 60 ක් ඇතුළත ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අවසර දෙනු ලැබේ. ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා අවසාන දිනය පාඨමාලා සමාරම්භක/ ශිෂ්‍ය දිශානති වැඩසටහනකට පෙර දිනය වේ.

13. (i) දින 60 කට පසුව ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් රැඳී සිටි කාලය සඳහා මසකට රු.5,000.00 ක් බැගින් අයකෙරේ. උපරිමය රු. 30,000.00 ක් මාස හයක් හෝ ඊට වැඩි කාලයක් සඳහා ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් අයකෙරේ.

(ii) අර්ධකාලීන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේදී, රු. 10,000.00 ක් ආපසු ගෙවිය හැකි මූලික මුදල් තැන්පතුව ලෙස අය කරනු ලබන අතර, එය පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලැබේ. ශිෂ්‍යයා පාඨමාලාව අවසන් කිරීමට පෙර පාඨමාලාව හැර ගියහොත්, මෙම තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. ලියාපදිංචියේ දී සම්පූර්ණ ගාස්තුව එකවර ගෙවන අර්ධකාලීන අයදුම්කරුවන් හට 10% ක වට්ටමක් ලබා දෙනු ඇත.

14. සතියේ දිනවල සහ සති අන්ත දිනවල පූර්ණ කාලීන හා අර්ධ කාලීන සිසුන් සඳහා සමාසික අවසාන වාර විභාග පවත්වනු ලැබේ.

15. අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස.(සා.පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.

16. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්කරුවකුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. 2026 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

18. උසස් තාක්ෂණ ආයතනවල පවතින ආසන ධාරිතාව මත පදනම්ව බඳවා ගැනීම් සිදුකෙරේ.

19. මාර්ගගතව අයදුම්පත් යොමුකිරීමට පහසුකම් නොමැති සිසුන්ට එම සේවාව ලබාගැනීම සඳහා ළගම ඇති උසස් තාක්‍ෂණ ආයතනය වෙත පැමිණ එම සේවය ලබා ගත හැක.

20. අයදුම්කරුවන් විසින් උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී තම පදිංචි ස්ථානයට ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත අයදුම් කිරීම සුදුසු වේ.

21. වැඩිදුර තොරතුරු සඳහා **www.sliate.ac.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026 අගෝස්තු මස 03 දින වේ.**

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
(SLIATE)
නො: 53 A,
වෛද්‍ය පාර,
දෙහිවල.

07 - 98

---

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරු (SL-01-2025) සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය (SL-01-2025) ට අදාළ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ පුරප්පාඩු සඳහා එක් එක් තනතුරට නියමිත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් මේ සමඟ ඇමුණුම් කර ඇති ආකෘතිය අනුව සකස් කළ අයදුම්පත්‍රයක් 2026.08.03 දින හෝ ඊට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

| අනු. අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| i. | සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ හා ලේඛනගත කිරීම්) | 01 |
| ii. | සහකාර අධ්‍යක්ෂ (කැණීම්) | 01 |
| iii. | සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) | 01 |
| iv. | සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) | 05 |
| | **මුළු සංඛ්‍යාව** | **08** |

**01. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගෙන් ලිඛිත විභාගයකින් හා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහි දී විවෘත තරග විභාගය සමත් වූවන්ගෙන් උපරිම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙලට සහ ඔවුන්ගේ මනාපය සළකා බලා පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට කටයුතු කරනු ඇත.

**02. ලිඛිත විභාගය :**

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර විවෘත තරග විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පැවැත්වීමට කටයුතු කරනු ඇත.

- පොදු ප්‍රශ්න පත්‍රය
- සාමාන්‍ය බුද්ධි ප්‍රශ්න පත්‍රය
- කළමනාකරණ අභියෝගතාව

**ලිඛිත විභාගය** :- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වෙනු ලැබේ.

**විභාග දිනය** : මෙම විභාගය 2026 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

**03. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :** ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන්ගෙන් එක් එක් විෂයය සඳහා 40% වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර ඒ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර ඒ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :** රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට සහ 2019.10.01 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ (SL-01-2025) බඳවා ගැනීම් පටිපාටියට අදාළ සියලු කොන්දේසිවලට ද, එම බඳවා ගැනීම් පටිපාටියට කර ඇති හෝ මතුවට සිදු කෙරෙන සියලුම සංශෝධන වලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු එම නිලධර ගණයේ (SL-01-2025) III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

**04.01** පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ/ පත් කරන ලද රාජකාරියෙහි හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

**05. මාසික වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 82,150-10x2,400 -8x2,940 – 17x3,900 - රු. 195,970/- (SL-01-2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව වේ.

පත්වීම් දින සිට වසර 03ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සහ II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම ද, 1 ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

**06. සෞඛ්‍ය හා චරිතය:**

සෑම අපේක්ෂකයෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික සෞඛ්‍යය තත්වයකින් යුතු විශිෂ්ඨ චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතු ය.

**07. සුදුසුකම්:**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
II. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

| *අ: අ* | *තනතුරු* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| I. | සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ හා ලේඛනගත කිරීම්)<br><br>සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා)<br><br>සහකාර අධ්‍යක්ෂ (කැනීම්) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරාවිද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |
| II. | සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පුරාතාක්ෂණවේදී විෂය සහිත ඉංජිනේරු තාක්ෂණවේදී උපාධියක් / නිර්මිත පරිසරය පිළිබඳ උපාධියක් / වාස්තු විද්‍යාව පිළිබඳ උපාධියක් / පුරාවිද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |

***සටහන* :** ඉහත 7. II හි එක් එක් තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් යටතේ සඳහන් උපාධි සුදුසුකම,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් විය යුතු ය.

III. මෙම විභාගයට අයදුම් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යා සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

- ඉහත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තනතුරක වසර පහකට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.

**08. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු. 1,000/-කි. එය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 086100169026207 වෙත බැර කර මුදල් ගෙවීම් කුවිතාන්සිය/ විද්‍යුත් මාර්ග ගත ඔස්සේ මුදල් බැරකිරීම් රිසිට්පත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. (ලදුපතෙහි ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.)

**09. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

I. ඉදිරිපත් කළයුතු අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1 සිට 4 දක්වාත් 02 වන පිටුව අංක 5 සිට 9 දක්වාත් 03 වන පිටුව 10 සිට 13 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම් පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.)

II. අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු ය. තව ද එක් අයදුම්කරුවෙකුට එක් අයදුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ හැකි ය.

**මනාපය සටහන් කිරීම :** එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමට තිබිය යුතු සුදුසුකම් සපුරා ඇත්නම් අයදුම්කරුවකුට තනතුරු කිහිපයකට අයදුම් කිරීමට හැකියාව ඇත.අයදුම් කිරීමේ දී අයදුම්කරුවන් විසින් එක් එක් තනතුර සඳහා තම මනාප අනුපිළිවෙළ අයදුම්පතේ සටහන් කළ යුතු ය.

***සැලකිය යුතුයි :*** එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කිරීමේ දී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාප අනුපිළිවෙළ පසුව සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරු විසින් මනාපය සටහන් කර නොමැති තනතුරු සඳහා පත්වීම් ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් කිසිදු කරුණක් මත සලකා බලනු නොලැබේ.

III. විභාගය සඳහා වන නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2026.07.27 දිනට පෙර ලැබෙන සේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, තැ.පෙ. 532, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07 ලිපිනය වෙත එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ "පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක ශ්‍රේණිය (SL-01) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු, රු. 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජක කෙනෙකු විසින් සහතික කළ යුතු ය.

V. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

**10.** විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට වන පිළිගැනීමක් ලෙස සැළකිය නොහැකි ය.

**10 (i)** විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම කෙටි පණිවිඩයක් (SMS) මගින් ඒ බව විභාග අපේක්ෂකයින් වෙත දැනුම් දෙනු ලැබේ. කෙටි පණිවිඩය යොමු කර දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවකු වේ නම් කෙටි පණිවිඩයේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතු ය. එහි දී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය.

**අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය** : තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු රියදුරු බලපත්‍රය.

**11.** **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :** අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම්, ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**12.** මෙම රෙගුලාසිවල නොමැති කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**13.** **තෝරාගැනීමේ ක්‍රමය :** පහත සඳහන් විෂය නිර්දේශයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකින් මෙම විභාගය පවත්වනු ලබයි. ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් ඉහත 03 ඡේදය යටතේ දන්වා ඇති පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| පොදු ප්‍රශ්න පත්‍රය | • මෙරට පුරාවිද්‍යා නීති හා රෙගුලාසි<br>• ජාතික, කලාපීය සහ ලොව විවිධ සමාජ, ආර්ථික පරිසරයන් සහ මෙරට සමාජමය, සංස්කෘතික, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා විද්‍යාත්මක සාධක හා ඒවායෙහි මූලික ලක්ෂණ වෙනස් වීමේ උපනති සම්බන්ධ සාමාන්‍ය දැනුම හා අවබෝධය මැන බලන ප්‍රශ්න පත්‍රයකි. |
| සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| කළමනාකරණ අභියෝගතාව | ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාවය, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනා දී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අපැහැදිලිතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ (SL-1) III ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

1.
2.
3.
4.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :**
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අයදුම් කරන තනතුරු අනුපිළිවෙලින් මෙහි සඳහන් කරන්න)

1. 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................
.............................................................................................

1.2 සම්පූර්ණ නම (MR/MRS/MISS) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.............................................................................................
.............................................................................................

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/ මෙය) (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................
.............................................................................................

1.4 මුලකරු සමඟ නම ((MR/MRS/MISS) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.............................................................................................
:.............................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................................................................

2. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

3. 3.1 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.2 2026.07.27 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4. 4.1 ස්ථිර ලිපිනය :...........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ...........................................................................................................
4.2 ස්ථිර ලිපිනය : ...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................................................
4.3 දුරකථන අංකය : ස්ථාවර - ...........................................................................................................
ජංගම -...........................................................................................................

5. අධ්‍යාපන සුදුසුකම් :

| *විශ්ව විද්‍යාලය* | *හදාරා ඇති උපාධි පාඨමාලාව* | *වලංගු දිනය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

6. වෘත්තීය සුදුසුකම් :

| *ආයතනය* | *වෘත්තීය සුදුසුකම්* | *පාඨමාලා කාලය* |
|---|---|---|
| | | |

7. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටීනම් දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

7.1 වර්තමාන සේවා ස්ථානය :...........................................................................................................
7.2. දැනට දරන තනතුර හා ශ්‍රේණිය :...........................................................................................................
7.3 තනතුරට පත් වූ දිනය :...........................................................................................................
7.4 දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සේවා කාලය :...........................................................................................................
7.5 තනතුරෙහි ස්ථිර කළ දිනය :...........................................................................................................

8. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? ඔව් / නැත

9. විභාගය ගාස්තු ලෙස රු.1000.00 ක් ගෙවන ලද ලදුපත පහත සඳහන් කොටුවෙහි අලවන්න.

10. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

................................................... ...................................................

දිනය අයදුම්කරුගේ අත්සන

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන තැබූ බව ද සහතික කරමි.

................................................... ..............................................................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

12. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටී නම් අංශභාර අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ හෝ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................. මයා/මිය/මෙනෙවිය මාගේ අංශයේ/ කාර්යාලයේ ............................................. දින සිට ..................................... තනතුරේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

....................................... ..........................................................................

දිනය අංශභාර අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ හෝ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව

13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන් සඳහා පමණි.)
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................. මයා/මිය/මෙනෙවිය මෙම කාර්යාලයේ ............................................. දින සිට ..................................... තනතුරේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ (SL-1) III ශ්‍රේණියේ තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළහැකි බවත් මෙයින් සහතික කරමි.

....................................... ..............................................................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

07-45

**ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරි (සිවිල්) (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) පුරප්පාඩුවලට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 06 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 අගෝස්තු 03 දින ප.ව.9.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්කරන්නේ නම් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරෙහි පවතින පුරප්පාඩු 01ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. ගොඩනැගිලි ඉදිකිරීම, නවීකරණය හා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම, මැනීම හා මට්ටම් ගැසීම, ප්‍රමාණ සමීක්ෂණය, ගොඩනැගිලි නිර්මාණය හා පවිත්‍රතා කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය යන රාජකාරිවලින් සමන්විත තනතුරකි.

**01. සේවා කොන්දේසි :**

**රජයේ සේවයේ පත්වීම් සිදුකිරීමේ දී අදාළ කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් තාක්ෂණ නිලධාරි (සිවිල්) (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.**

**02. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :**

වැටුප් කේත අංකය : MN 3-2025
වැටුප් පරිමාණය : රු. 52,250 – 10×800 –11x1,190 – 10x1,320 – 10x1,350 – රු. 100,040/-

**03. අධ්‍යාපන සුදුසුකම් :**

ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව/ ඉංජිනේරු තාක්ෂණවේදය / තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙක (02) ක් සහිතව විෂයන් තුන (03) කින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

**04. වෘත්තීය සුදුසුකම් :**

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව;

*හෝ*

III. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

IV. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**05.** **පළපුරුද්ද :** අදාළ නොවේ

**06.** **කායික සුදුසුකම් :**

**සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.**

**07.** **වෙනත් :**

(i) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම. (දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්)

**08.** **වයස් සීමාව :**

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2008.08.03 දින හෝ ඊට පෙර හා 1996.08.03 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)**

**09.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

**10.** **ලිඛිත විභාගය :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

**විෂය නිර්දේශය පහතින් දැක්වේ.**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | සංඛ්‍යාමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානු බද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස<br>පරිසරය, විද්‍යාත්මක සොයා ගැනීම්, විද්‍යා දැනුම, ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ය. (පැය 01)<br>II වන කොටස<br>විෂයානුබද්ධ ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්ත ය. (පැය 01) |

**11.** **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.**

**12.** **විභාග ගාස්තුව :**

**විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.**

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);

iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method, Bank of Ceylon/ Flex App);

iv. Flex යෙදවුම මගින් (Flex App of Bank of Ceylon);

v. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

**13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

**මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**14. විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම:**

**(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික** හැඳුනුම්පත් අංකය, ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම දැන්වීමේ පළ කර ඇත.

(*ඇ*) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(*ඈ*) ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින්

විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(ඉ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

**15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

**විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම** ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**16.** ***සැලකිය යුතු ය :***

**(අ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.**

**(ආ)** දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් විභාග අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**17. පත් කිරීම සඳහා තෝරා ගැනීම :**

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

**18. ප්‍රතිඵල නිකුත් කිරීම :**

**අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.**

**19. සාවද්‍ය තොරතුරු සැපයීම :**

**අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.**

**20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.**

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2026 ජුනි මස 18 දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

07 - 126

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2026.09.04 | සිකුරාදා | 2026.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.11 | සිකුරාදා | 2026.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.18 | සිකුරාදා | 2026.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.25 | සිකුරාදා | 2026.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.